3 වන පිටෙන්

සංඛ්‍යාත ජනතාවක් එක්රොක් වෙලයි හිටියේ. විජය සම්පූර්ණයෙන්ම උදව් කළේ හෙක්ටර් කොබ්බෑකඩුව දිනවන්න. ඔහු ජනධිපති කරවන්න. අනුර බණ්ඩාරනායකගේ කොන්ත්‍රාත් කතාවත් සමග ශ්‍රීලංනිප, ශ්‍රීලංමප දේශපාලනඥයන්ගෙ විතරක් නෙවෙයි ලක්ෂ සංඛ්‍යාත ඡන්දදායකයන්ගෙත් ඔලු මඤ්ඤං වුණා. ඡන්දෙන් කොබ්බෑකඩුව පරාජයට පත් වුණා විතරක් නෙමෙයි ඒ හිතේ අමාරුවෙන්ම එතුමා ඊට ටික කලකට පස්සෙ අභාවප්‍රාප්ත වුණා.

ඔන්න ඔය වගේ ඓතිහාසික පැටික-



රියක් තියෙන අනුර බණ්ඩාරනායකගේ කට මහින්ද විජේසේකර ඇවිස්සුවා. ඇත්තටම අනුර බණ්ඩාරනායකටත් මහින්ද රාජපක්ෂ සමග කෝන්තර තිබෙන්න පුලුවනි. මව් පිය උරුමයෙන් පක්ෂයේ පමණක් නෙවෙයි රටෙත් නායකයා වෙන්න බලය තිබෙන නමුත් හැමදාමත් මහින්දගේ දෙවැනියා නේදැයි යන ශෝකාකූල සිතිවිල්ල අනුරගේ හිතෙත් ඇති. මහින්ද රාජපක්ෂගේ දෙවැනි මනමාලයා වුණෙත් අනුර බණ්ඩාරනායක. අනුර ශ්‍රීලංනිපයෙන් එජාපයට පැන්න වෙලාවේ පක්ෂයේ බර කරට ගත්තේ මහින්ද. මහින්ද අගමැති වුණා. අනුර ඇමැති කෙනෙක් වුණා. අන්තිමට මහින්ද ජනධිපති අපේක්ෂකයා වුණා. අනුර අගමැති අපේක්ෂකයා වුණා. ඉතින් මහින්ද රාජපක්ෂ රටේ ජනධිපති වුණාට පස්සේ එතුමාට සර් කියලා කතා කරන්න නේද අනුර බණ්ඩාරනායක මහත්තයට සිද්ධ වෙන්නේ. ඉතින් එහෙම කියන්න අනුරගේ දිව නැවෙයිද?

අඬන්න ඉන්න මිනිහගේ ඇහැට ඇඟිල්ලෙන් අනිනවා වගේ මහින්ද විජේසේකර කියාපු කාරණාවත්. රාජපක්ෂට අතීතයේ පටන් දෙවෙනියා වීමේ ශෝකයත් අනුර බණ්ඩාරනායකට තදින්ම බලපෑවා. යූඇන්පී ය දීපු ලනුවේ දිග පළල බලන්නෙ නැතිව අනුර විතරක් නෙවෙයි ජනධිපතිනි චන්ද්‍රිකාත් ඒක ගිල්ලා. එජාපයේ උපක්‍රමය ඉතා සාර්ථක වුණා. අනුර ජවිපෙට පතුරු යන්න බනින්නෙත් මහින්දගේ ජනධිපතිවරණ වේදිකාවට නොඑන්නෙත් එජාප උගුලේ හිරවුණ නිසා.

මේ වෙනකොට මහින්ද රාජපක්ෂ මහත්තයාට සටන් කරන්න සිද්ධ වෙලා තියෙන්නෙ එජාප ජනධිපති අපේක්ෂක රනිල් සමඟ පමණක් නොවේ. තමන්ගේම පක්ෂයේ දැවැන්තයන් සමග. ජනධිපතිවරණ සටන් ඉණිමගේ මහින්ද අඩි දහයක් උඩට නගිනකොට චන්ද්‍රිකයි අනුරයි මහින්දගේ කකුල් දෙකෙන් පහළට අදින තත්ත්වයක් මේ වෙනකොට පෙනෙන්න තිබෙන්නේ.

මොකක්ද මේ කකුල් දෙකෙන් අදිනවා කියන කතාවේ තේරුම.? ඒ තමයි ජනධිපතිනි චන්ද්‍රිකාත් අගමැති අපේක්ෂක අනුරත් මහින්ද රාජපක්ෂගේ ජනධිපතිවරණ ප්‍රතිපත්ති ජවිපෙ ගිවිසුම් සහ සම්බන්ධකම් දිගට හරහට විවේච-නය කිරීම.

පසුගිය දාක කොළඹදී ශ්‍රීලංනිපයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ රැස්වීමක්

**මේ වෙනකොට මහින්ද රාජපක්ෂ මහත්තයාට සටන් කරන්න සිද්ධ වෙලා තියෙන්නෙ එජාප ජනධිපති අපේක්ෂක රනිල් සමඟ පමණක් නොවේ.**

චන්ද්‍රිකා මහත්මියගේ ප්‍රධානත්වයෙන් තිබුණා. ඒ රැස්වීමේ කතා කරපු චන්ද්‍රිකාගේ ප්‍රධාන මාතෘකාව වුණේ ජනතා විමුක්ති පෙරමුණේ පන්ති පහ විස්තර කිරීමයි. ඒ පන්ති පහෙන් එකක තිබෙනවාලු ශ්‍රීලංනිපය විනාශ කළ යුතුයි කියලා. ඉතින් මහින්ද රාජපක්ෂ ජවිපෙත් එක්ක ගිවිසුම් ගහලා ජනධිපතිවරණයට බැස්සේ ඉන් ජයග්‍රහණය කරලා ශ්‍රීලංනිපය දියකර හරින්න බව ජනධිපතිනිය කිව්වා. ඒ නිසා ශ්‍රීලනිපය රැකගෙන මහින්දවත් රැකගන්නැයි ජනධිපතිනිය මෙම රැස්වීමේ දී ඉල්ලා සිටියා.

මේ කතාව විතරක් නෙමෙයි. එතුමිය සහභාගි වන උත්සව රැස්වීම් අතුරින් කීපයකදී නොවරදවාම ජවිපෙට ප්‍රහාර එල්ල කරන තත්ත්වයක් දැන් තිබෙනවා. පුද්ගලික ජනමාධ්‍ය වලට මේවා හොඳ ලුණු ඇඹුල් සහිත කතා. ඒ නිසා ජනධිපතිනියගේ සම්පූර්ණ කතාවේ වලිග කෑලි සංස්කරණය කොට දවස පුරාම ඒවා පුද්ගලික රූපවාහිනි චැනල් ඔස්සේ විසිරුවා හරිනවා. ඈත ගම් නියම් ගම් වලට පුද්ගලික රූපවාහිනී සේවා පැහැදිලිව ප්‍රදර්ශනය වුණේ නැතත් මුළු දිවයිනේම ප්‍රධාන දිස්ත්‍රික් සියල්ලේම ශ්‍රීලනිප ඡන්ද දායකයෝ ජනධිපතිනියගේ මේ කතාව අහනවා. අහලා අන්දුන් කුන්දුන් වෙනවා. ඔය අතරෙම තමයි ජනාධිපතිනිය කිව්වේ මහින්දට ජය පතා තමන් සහභාගි වන රැස්වීම් කිසිවකට ජවිපෙට ආරාධනා කරන්න එපා කියලා.

මහින්ද රාජපක්ෂගේ ජනාධිපතිවරණ සටනේ බර මුළුමනින්ම පාහේ කරට අරගෙන වැඩ කරන්නේ ජවිපෙ. රැස්වීම් පැවැත්වීම, අත් පත්‍රිකා බෙදා හැරීම ඇතුළු ජවිපයේ දේශපාලන යාන්ත්‍රණයේ සෑම ඇණයක් මුරිච්චියක්ම වෙහෙ-සෙන්නේ මහින්දගේ ජයග්‍රහණය වෙනුවෙන්. මේ සටනේ දී ජවිපේ සගයන්ට වැඩිපුරම හමුවන්නේ පාරම්පරික ශ්‍රීලනිප ඡන්දදායකයන්. ශ්‍රීලනිපය දියකර හැරීමේ කුමන්ත්‍රණ කතාවත් ජනාධිපතිනියගේ හඬින් මේ වන විට අසා තිබෙන ශ්‍රීලනිප ඡන්දදායකයෝ ජවිපෙ දිහා බලන්නෙ වපර ඇසින්. ඒක ඉතාමත්ම භයානක තත්ත්වයක්. මහින්ද රාජපක්ෂට අවාසි සහගත එජාප අපේක්ෂක රනිල් දිනුම් කනුවට ළඟා කරවන සැළසුම් සහගත දේශපාලන කුමන්ත්‍රණයක් බවයි මෙම තත්ත්වය අපට පෙනෙන්නේ.

ඒ විතරක්ද? මීට සති දෙකකට පමණ පෙර දවසක් හැන්දෑවක එජාප ජනාධිපති අපේක්ෂක රනිල්ව හදිසියේ ම ජනාධිපතිනිය ජනාධිපති මැදුරට කැඳෙව්වා. එම අවස්ථාවේ එතුමිය රනිල් සමග කතා කළේ ජනාධිපතිවරණය සාමකාමීව පවත්වන ආකාරය ගැනත් මැතිවරණ නීති අකුරටම ක්‍රියාත්මක කිරීම ගැනත් ඊට එජාප සහය ලබා ගැනීම පිලිබඳව පමණක් බවත් පසුව වාර්තා වුණා. පුදුමය කියන්නේ මෙම හමුවට ශ්‍රීලනිපයේ ජනාධිපති අපේක්ෂක මහින්ද රාජපක්ෂට ඇරයුම් නොකිරීමයි. ඇයි දෙයියනේ.. ජනාධිපතිවරණය සාමකාමීව පවත්වන්නේ කොහොමද කියලා සාකච්ඡා කරන්න අවශ්‍ය නම් අපේක්ෂකයන් දෙනොවම කැඳවීම නේද ඉතා සුදුසු. මේ නිසා සැකයක් ඇති වෙනවා ජනාධිපතිනිය නටන්න හදන නැටුම මොකක්ද කියලා.

මහින්දට අවාසි සහගත ඔහුගේ හිත රිදෙන තවත් පියවරක් ජනාධිපතිනිය පසුගිය දා අරගත්තා. වතු යටිතල පහසුකම් ඇමතිවරයා හැටියට පසුගිය කාලයේ දී කටයුතු කළේ නුවරඑළිය දිස්ත්‍රික් මන්ත්‍රී සී බී රත්නායක මහත්තයා. ඔහු මහින්දට හිතවත් පුද්ගලයෙක්. ඒ විතරක් නෙමෙයි. පොදු පෙරමුණේ සිට එජාපයට ගිය නුවරඑළිය දිස්ත්‍රික් මන්ත්‍රී එස් බී දිසානායක සමග කරට කර හැපෙමින් නුවරඑළිය රැක ගන්නට සී බී රත්නායක සටන් කළා. තොන්ඩමන් පොදු පෙරමුණට පැමිණීමත් සමග ජනාධිපතිනිය සී බී ගෙන් වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය ඉවත් කොට ඒක තොන්ඩමාන්ට දුන්නා. තොන්ඩමාන් ජනාධිපතිවරණයේදී රනිල්ට සහය දෙන්න එජාපයට ගියා. ඒ නිසා ඔහුගෙන් පුරප්පාඩු වුණ අමාත්‍යාංශය සී බී ට නැවතත් දීම යුතුකමක් වුණත් ජනාධිපතිනිය ඒක දුන්නේ බදුල්ල දිස්ත්‍රික් මන්ත්‍රී ඩිලාන් පෙරේරා ට. ඩිලාන් මහින්ද පාක්ෂිකයෙක් නොවීමයි ඒකට ප්‍රධාන හේතුව. ඔහු චන්ද්‍රිකා පාක්ෂිකයෙක්.

චන්ද්‍රිකාගේ මෙම හැසිරීම් අනුව රටට යන සිග්නල් එක ඒ තරම් මහින්දට හොඳ නැහැ. මේ වෙනකොට සමහර දිස්ත්‍රික්ක වල ශ්‍රීලනිප ආසන සංවිදායකයන් සහ මන්ත්‍රීවරුන් ඉන්නේ සම්පූර්ණයෙන්ම පැත්ත ගහලා. ඒකට ප්‍රධාන හේතුවක් තමයි චන්ද්‍රිකා. මහින්ද රාජපක්ෂට හිතවත් මන්ත්‍රීවරුන් අතළොස්සක් හිටියත් එතුමන් පසුගිය කාලයේදී උනන්දු වුනේ නැහැ තමන්ට පාක්ෂික මන්ත්‍රී කණ්ඩායම වැඩි කර ගන්න. ඒ නිසා වැඩි මන්ත්‍රී පිරිසක් අනුගමනය කරන්නේ චන්ද්‍රිකා යන පාරේ යාම. චන්ද්‍රිකා කියන දේ අහලා ඒ අනුව වැඩ කරන්න.

තවත් කාරණාවකි තියෙනවා. පසුගිය මැතිවරණයේ දී සියලුම දිස්ත්‍රික් වල අංක 1,2 හෝ 3 ට ආවේ ජවිපේ අපේක්ෂකයෝ. ඔවුන් ඇතුළු ජවිපේ සගයන් අතින් තමයි මහින්දගේ ජනාධිපතිවරණ සටන ක්‍රියාත්මක වී තිබෙන්නේ. මෙන්න මේ තත්ත්වයට චන්ද්‍රකාට පක්ෂ ශ්‍රීලනිප මන්ත්‍රීවරුන් සහ ආසන සංවිධායකවරුන් සතුටු නැහැ. ඔවුන්ට විශාල බයක් තිබෙනවා. මොකක්ද ඒ බය.? ඒ තමයි මහින්ද රාජපක්ෂ රටේ ජනාධිපතිවරයා වුණොත් තමන්ගේ ආසන සංවිදායක කම් සහ මන්ත්‍රීකම් ගහලා යාවී කියන බය. ඒ තනතුරු ජවිපෙට හිමිවේවි යි කියන අධික බිය.

කොහොම වුණත් ජවිපේ ඡන්දවලින් විතරක් මහින්දට දිනන්න බැරි විත්තිය කවුරුත් දන්නා කාරණාවක්. ජනාධිපතිවරණයේදී ශ්‍රීලනිප ඡන්ද මහින්දගේ ජයග්‍රහණය තහවුරු කරන්න අනිවාර්යයෙන්ම සාධකයක් වෙනවා.

මේ වෙනකොට මහින්ද ට එරෙහිව පුද්ගලික මාධ්‍ය හරහා එල්ල වෙමින් තිබෙන මඩ ප්‍රහාර නිදොස් කරන්නට හෝ ප්‍රති පිළිතුරු දෙන්නට ජනාධිපතිනිය ගේ පාර්ශවයෙන් කිසිවකු හෝ ඉදිරිපත් නොවීමත් විශේෂ කාරණාවක්. මහින්ද රාජපක්ෂට විශාල සහයෝගයක් ලබා දුන් පුද්ගලික මුද්‍රිත මාධ්‍යයක් වූයේ ලක්බිම පුවත්පතයි. එහි හිමිකරු වන තිලංග සුමතිපාල මහත්මයාව රැක ගන්නට මහින්දගේ පාර්භවයෙන් උනන්දුවක් තිබුණෙත් නැහැ. ඒ හිඩැස පුරවන්න රනිල් වික්‍රමසිංහ වහා ඉදිරිපත් වුණා. තිලංග සුමතිපාලට අනුරාධපුර එජාප සංවිධායක ධුරය පිරිනැමුවේ ජනාධිපතිවරණයේ සහය පමණක් නොව අනාගත බලාපො-රොත්තු රැසක්ද ඔහුගේ මාධ්‍ය ජාලය හරහා ඉටු කරවා ගැනීමේ අරමුණ ඇතිව.

ජාතික රූපවාහිණිය තමන්ට නොසලකන බව කියන්නේ මහින්දමයි. රනිල් වික්‍රමසිංහගේ ජනාධිපතිවරණ දැන්වීම් දිගට හරහට ජාතික රූපවාහිණියෙන් විකාශය කරන බව ඔහු චෝදනා කළා. ඊට පිළිතුරු දුන් පෑපවාහිනියේ ජනාධිපතිනියගේ සගයකු වන උසස් නිලධාරියෙක් පැවසුවේ රනිල්ගේ දැන්වීම් වලට මුදල් ගෙවා අවසන් බවත් මහින්ද මහත්තයාගේ දැන්වීම් වලට තවම මුදල් අනුමත වී නොමැති බවටත් හීන් ඇනුම් පදයක් ද සමඟින්.

මේ තත්ත්වය උඩ මහින්ද ඉන්නේ අත උඩින් ගහලා දිනන තරගයක නෙවෙයි. චන්ද්‍රිකා රනිල්ට සපෝට් කරන විදිහටයි මේ සටන දැන් ප්ලෑන් වෙලා තියෙන්නේ-න්. හැබැයි මහින්ද රාජපක්ෂ මේ සටන කොහොම හරි දිනා ගන්නා බවයි බහුතර ජනතාවගේ මතය.

මෙම ලිපිය සන්නසින් කියවන්නට ලැබෙන විට ශ්‍රී ලංකාවේ නව ජනාධිපතිවරයා පත් ව අවසානි. දේශපාලන මඩ ගොහොරුවේ අප්‍රසන්න දුගඳ මොන තරම් හැමුවත් ඔබත් අපත් ප්‍රාර්ථනා කරමු නව ජනාධිපතිවරයා යටතේ රටට සාමය, සමගිය සහ සමෘද්ධිය. රටේ ජනතාවට දුකක්, බරක් නොවී දිවි ගැට ගහගන්නට හැකි ආර්ථික රටාවක්.

අනුර හොරේෂස්